# කවි සහ කෝරවිලි



B.A. THISENI ONADEE BANDARA

# කවි සහ තේරවිලි

**B.A. THISENI ONADEE BANDARA**

# කවි සහ තේරවිලි

බී.ඒ.තිසෙනි ඔනාදී බණ්ඩාර

5 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල

මහනුවර.

මුද්‍රණය

2025.02.08

කතෘ ගේ වෙනත් කෘති

- **නරක මිතුරු ඇසුර**
- **ගස් මුදුනේ සිට ගී ගයන කොහාගේ සත්‍ය කතාව**
- **කඩිසර කූඹියෝ**

ISBN- 978-624-208-295-0

# පිදුම

මිණිකැට මෙන් මුතු අකුරු
පද බැඳ
සිප් සතර මුල පුරන්නට දිරිය දුන්
මාගේ හදා ගුරු මෑණියන්ට ද
නිතැතින් මාගේ සෙවනැල්ල මෙන්
හිඳිමින් සියලු කාර්යන්ට ශක්තියක්
වන
මාගේ මවට, පියාට
පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# මුහුද

හෝ හෝ ගා රැළ ඇදෙනවා
ගස් වැල් තාලෙට නටනවා
මුතු කැට මෙන් දිලිසෙනවා
මහ සයුරයි දිස්වෙන්නේ

මුතු කුමාරියෝ ඇතින්
අත වනමින් පීනනවා
කවඩි සිප්පි කටුද බෙල්ලෝ වෙරලට
ගහගෙන එනවා
කාගෙත් සිත් සතුටු කරන
මහ සයුරයි මේ

රන් වතුරක් සේ සවසට
දිලිසෙනවා මට පුදුමයි පුදුමයි
හිරු ගිලෙනවා සේ දැක්කම
මට පුදුමයි මට පුදුමයි



# අවුරුදු කාලය

චට පට චට පට රතිඤ්ඤා
සද්දේ
එරමුදු මල් පිපී ඇත සුවඳ
හමන්නේ
තෙල් බේරෙන කැවිලි වලින් කුස
පුරවන්නේ
අවුරුදු කාලේ සිරි මේ
පවසන්නේ

කොහා හඬන්නේ සිරිය ගෙනෙන්නේ
රබන් සුරල් හඬ සද්දේ ගීත
ගයන්නේ
කුඩා ළමුන්ගේ වලලු නාදය
ගම පුරාම පැතිරී යන්නේ
සිරි සිරි ගා අතු කොළ නැටුවේ



# අපේ යහ පැවැත්ම

පාන්දරින් අදි වෙලා
දත කට මුව සෝදාලා
දෙමාපියන් පා වැඳලා
හනික යමු පාසල වෙත

ගුරුවරු කී දේ අසා
නිවැරදි දේ කරමිනා
සතුටින් සිටියොත් සදා
කවුරුත් පවසති සොඳා

අනුන් ගැන සිත සිතා
තමන් ගැනද සිතමිනා
සැමදාමත් කලොතින් වැඩ
නිසකව යහපතක් වෙතා

තමාගේ ආගම අදහා
අනුන්ගේ ආගම් වලටද
ගෞරව කරමින් සිටියොත්
කාගෙත් සිත් ඇදගනියි

තමන්ගෙ නොවනා දෙයක්
'මගේ ' කියමින් කෑ ගසා
ගුණ ධර්මෙන් යුතු කෙනා
දෙව් ලොව යයි සැමදිනා



# වනයක අසිරිය

ලා දළු අතරින්
වැටෙනා හිරු රැස්
රන් උල්පත් මෙන්
කාගෙත් සිත් අවදි කරන්නේ

ගුමු ගුමු සද්දේ මී මැස්සන්ගේ
ගහ කොළ අතු නැළවෙන් සද්දේ
රෑං රෑං රන් කුඹලාගේ
මේ ගීත වලින් සිත් සසල කරයි

ගීත ගයන්නේ
රළ පෙරළෙන්නේ
සුළං රැළි ද හමන්නේ
පාට පාට මල් පිපී වනය
සුන්දර කරන්නේ

ඇළ දොළ ගංගා
මී වද පුරවා
රටා මවා ගීත මවා
වනයක සිරි මේ පවසන්නේ



උදේ සවස නිදියන්නේ
රෑට කෑම සොයන්නේ
කීවොත් හපනා කියයි

බකමූණා






උදේ සවස හෝ හෝ හෝ ගානවා
සැවොමගෙම සිත් සතුටින් පුරවනවා

මුහුද

විවිධ වර්ගයෙන් දිස්වෙන්නේ
දැක්කම ආස හිතෙන්නේ

මල්



පාට පාට අත්තටු තියෙනවා
මල්වල පැණි බී යනවා

සමනලයා

අව්වෙන් වැස්සෙන් සුරකින්නේ
බිත්ති වලින් වට වී ඇත්තේ

නිවස






කැලේ රජත් මමයි
දරුනුම සතත් මමයි
කියන් මගේ නම

සිංහයා

අවුරුදු කාලෙට සුවඳ හමන්නේ
කැවුම් ද කිරිබත් රස වැඩි වෙන්නේ
කියන්න අපි කවු ද?

කැවිලි



උස ගහකින් බිමට වැටෙනවා
කෑමට හරි රසයි රසයි

පොල්

යන එන විට සැමවිට මම කකුල් දෙකේ
එක එක කඩවල්වල මම දිස්වෙන්නේ

**සපත්තු, සෙරෙප්පු**



කකුල් හතරෙ කෙනෙකි මම
බඩු තියන්න උදවු වෙමි මම

**මේසය**



තීන්ත වලින් පුරවලා තියෙනවා
ලිවීමට හරිම වැදගත්

**පෑන**

පෝය දාට බැබලෙනවා
රැළිවලින් සරසනවා

**වෙසක් කූඩුව**

# මගේ රට

ඵල වැල් පුෂ්පයෙන් පිරී
මල් සුගන්ධයෙන් පිරී
සුර විරුවන් වූ පොළොවේ
මගේ මව් බිම ලංකා

මහ රැළ් සයුරේ
පීනමින් නාන සේ
වැල් මත්තේ දුව පනිමින්
සිත් සොතින් සිටිමු ලංකා

මුතු වැල් වරුසා වසින්නේ
යලට මහට වැඩපල කෙරෙන්නේ
සුවඳැල් රත්හැල් දෝරේ ගලන්නේ
පින්බර මගෙ ලංකා




නොනවත්වා කටු කැරකෙනවා
වෙලාව හරියට කියනවා
ඔරලෝසුව





රාත්‍රියට ටිකක් දිලිසෙනවා
කාටවත් ගණනට නොහැකිය
තරු




නිල් කහ රතු තැඹිලි රෝස
බෝල තියෙනවා
ඊඳි කට්ටෙන් ඇන්න ගමන්
පිපිරී යනවා
බැලුන්

ගෑනු ළමුන්ගේ ප්‍රියතම ඇඳුමයි මම
මෝස්තරෙන් පිරී තියෙනවා
ගවුම

කවදාවත් ඇල්ලිය නොහැකිය
ගතට සනීපය දැනෙනවා

සුළඟ





බෝලයක් වගෙයි
රාත්‍රියට බැබළි බැබළී
අහසේ අඳුර මකා දමයි

සඳ

දැක්කම බය හිතෙනවා
මකුළු දැලේ සැමවිට ඉන්නවා

මකුළුවා

වේගයෙන් දුවනවා
තරඟ වලට යනවා
කකුල් හතරෙ කෙනෙකි මම

අශ්වයා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ  මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර  ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට  එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්